# පෘතුගීසි, ලන්දේසි, බ්‍රිතාන්‍ය යුගවල ගොඩනැගිලිවලට අයත් දොර, ජනෙල්, උළුවහු සහ මෝස්තරාංග

ඒ. ඒ. එන්. ජී. අදිකාරි[1]

ක්‍රි. ව. 1505 දී සිදු වූ පෘතුගීසීන්ගේ ආගමනයත් සමඟ ක්‍රි. ව. 1948 වර්ෂය දක්වා අඛණ්ඩ ව පැවැති යටත් විජිත පාලනය හේතුවෙන් මෙරට දේශපාලන, ආර්ථික, සමාජීය, ආගමික සහ සංස්කෘතික වශයෙන් විවිධ පරිවර්තන සිදු විණි. යටත් විජිත පාලන සමයේ දී ශ්‍රී ලංකාවේ එතෙක් පැවති ගෘහ නිර්මාණ සම්ප්‍රදායය ද සුවිශේෂ වෙනස්කම්වලට භාජනය විය. විශේෂයෙන් ඒ යුගවලට අයත් දොර, ජනෙල්, උළුවහු සහ මෝස්තරාංග එවැනි වෙනස්කම්වලට බඳුන් විය. වර්තමානය වන විට නෂ්ටාවශේෂ ව හෝ නිරුපද්‍රැත ව පවතින යුරෝපීය යටත් විජිත පාලන සමයයට අයත් කොළඹ නගරයේ පිහිටි වඩාත් ප්‍රකට ගොඩනැගිලි සහ වෙරළබඩ ප්‍රදේශවල පිහිටි ගොඩනැගිලි මඟින් ඒවායේ දොර, ජනෙල්, උළුවහු සහ මෝස්තරාංග පිළිබඳ අධ්‍යයනයක නිරත විය හැකි ය. ලන්දේසි යුගයට අයත් ගොඩනැගිලි නෙදර්ලන්ත රාජ්‍ය අනුග්‍රහය යටතේ තවමත් සංරක්ෂිත ව පවතී. බ්‍රිතාන්‍ය සමයයට අයත් ගොඩනැගිලි බොහෝමයක් ඉතා යහපත් තත්ත්වයෙන් යුතු ව අදටත් විවිධ කාර්ය සඳහා යොදාගැනේ. එහෙත් පෘතුගීසි පාලන සමයයේ ඉදි වුණු ගොඩනැගිලිවල තත්ත්වය ඊට හාත්පසින් ම වෙනස් ය. සමකාලීන පෘතුගීසින්ගේ යටත් විජිත ව පැවති ගෝව, මලක්කා ප්‍රදේශ ආශ්‍රිත ව අදටත් ඉතිරි ව ඇති පැරණි පෘතුගීසි ගොඩනැගිලිවල දොර, ජනෙල්, උළුවහු සහ මෝස්තරාංග ඇසුරින් මේ අංග පිළිබඳ ව පැහැදිලි කරුණු අධ්‍යයනය කිරීමට හැකියාව ලැබේ. ලාංකික ගෘහ නිර්මාණ කලාවේ පැවැති "කවුළු" වෙනුවට පියන් සහිත "ජනේල" හඳුන්වාදෙනු ලැබූයේ පෘතුගීසින් විසිනි. පෘතුගීසීහු 'Double Arch Window' සහ 'Solar Type Window' වශයෙන් ජනේල වර්ග දෙකක් හඳුන්වාදුන්හ. දොරටු සහ ජනේලවල උළුවහුවලට ඉහළින් ගරාදි හෝ ලැටිස් ආවරණ, අලංකාර දැවමය කැටයම් සහිත හතරැස් සුළං කවුළු හෝ වීදුරු තහඩු යෙදූ කවුළු යෙදීම ලන්දේසි ගොඩනැගිලිවල සුලබ ව දැකිය හැකි විය. ලන්දේසි පාලන සමයයේ අවසන් භාගයේ නිර්මාණය වූ ගොඩනැගිලිවල එවක යුරෝපයේ ප්‍රකට ව පැවති ප්‍රංශ සහ ඉංග්‍රීසි ආභාසය සහිත දොර ජනේල දැකගත හැකි ය. ලන්දේසින් 1740 දී හඳුන්වාදුන් 'French Casement Windows' ඒ සඳහා හොඳ ම උදාහරණයකි. බ්‍රිතාන්‍ය පාලන සමයයේ ගොඩනැගිලිවලට පළල් ආරුක්කු, විශාල පළල් ද්විත්ව දොරවල් භාවිත වූ අතර ලූවර් පතුරු දොරවල් සහ ජනේල (Louvred Shutters and Doors) හඳුන්වාදෙනු ලැබිණ. මේ අනුව වසර සිය ගණනක යටත් විජිත පාලනයක් හේතුවෙන් ලාංකේය ගෘහ නිර්මාණ කලාවට යුරෝපීය ආභාසය සහිත නව දොර, ජනෙල්, උළුවහු සහ මෝස්තරාංග රැසක් එක් වී ඇති බව අවබෝධ වේ.

**ප්‍රමුඛ පද:** යුරෝපීය ආභාසය, දොර ජනේල, මෝස්තරාංග, ගෘහ නිර්මාණ ශිල්පය, ගොඩනැගිලි

---

[1] දෘශ්‍ය කලා සැලැසුම්කරණය සහ ප්‍රාසංගික කලා ඒකකය, ලලිත කලා අධ්‍යයනාංශය